රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 01/2017

මගේ අංක : EST-3/LNGUE/05/0179
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.03.08

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>එක් භාෂාවකට වැඩි භාෂා ගණනක ප්‍රවීණතාව ඇති රාජ්‍ය නිලධරයන්ට දිරි දීමනා ගෙවීම</u>**

භාෂා ප්‍රවීණතා දිරි දීමනා ගෙවීම සඳහා නිකුත් කරන ලද 1998.12.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/98, 2004.06.23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/98(I), රාජ්‍ය භාෂා සඳහා දිරි දීමනා ගෙවීම සම්බන්ධව නව විධිවිධාන ඇතුළත් කරමින් නිකුත් කරන ලද 2007.02.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2007 සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 සහ එම චක්‍රලේඛය වෙනුවට නිකුත් කරන ලද 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007හි 5 වගන්තිය මගින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2007හි විධිවිධාන 2007.07.01 දිනෙන් පසුව රාජ්‍ය සේවයට ඇතුළත් වන නිලධරයන්ට අදාළ නොවන බව සඳහන් කර තිබුණ ද සම්බන්ධීකරණ භාෂාව වන ඉංග්‍රීසි භාෂාව සඳහා භාෂා දිරි දීමනා ගෙවීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/98 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/98(I)හි විධිවිධාන 2007.07.01 දින සිට බඳවාගනු ලැබූ සහ ඉදිරියේ දී බඳවාගනු ලබන නිලධරයන්ට ද අදාළ කරගත හැක.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය